මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE


මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/55** **2024.08.29**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21
## තැපැල් ඡන්ද සලකුණු කිරීම හා ඒ සඳහා වලංගු හැඳුනුම්පත්

2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීම මතු දැක්වෙන පරිදි ඒ ඒ කාර්යාල හා දිනවල දී සිදු කරනු ලැබේ.

| අනු අංකය | කාර්යාලය | | තැපැල් ඡන්ද සලකුණු කරන දිනය |
|---|---|---|---|
| I | • දිස්ත්‍රික් ලේකම් කාර්යාල | | **2024.09.04** |
| | • මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යාල | | |
| II | • ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය පොලිස්පති කාර්යාල | නිල ඇඳුම් කාර්යමණ්ඩල හා එම කාර්යාලවලට අනුයුක්ත සිවිල් කාර්යමණ්ඩල | **2024.09.04** හා **2024.09.06** |
| | • පොලිස් අධිකාරී/ සහකාර පොලිස් අධිකාරී කාර්යාල | | |
| | • පොලිස් ස්ථාන | | |
| | • විශේෂ කාර්ය බලකාය , විශේෂ පොලිස් ඒකක සහ ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශ | | |
| III | • ත්‍රිවිධ හමුදා කඳවුරු | එම | **2024.09.05** හා **2024.09.06** |
| | • සෙසු සියලුම රාජ්‍ය ආයතන | | |
| IV | ඉහත I, II, හා III හි සඳහන් දිනවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකිවන තැපැල් ඡන්ද හිමියන්ට තමන්ගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී | | **2024.09.11** හා **2024.09.12** |

02. තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පහත දැක්වෙන හැඳුනුම්පතක් ඉදිරිපත් කර අනන්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි.

**I.** ජාතික හැඳුනුම්පත;
**II.** වලංගු රියදුරු බලපත්‍රය;
**III.** වලංගු විදේශ ගමන් බලපත්‍රය;
**IV.** මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත

03. රාජකාරි හැඳුනුම්පත තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පිළිගනු ලැබුව ද පසුගිය ඡන්ද විමසීම්වලින් පසුව ඒ සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු සැලකිල්ලට ගෙන, මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්දහිමියන් ස්වකීය රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරන්නේ නම් එම තැපැල් ඡන්දහිමියා හඳුනාගැනීම හෙවත් අනන්‍යතාව පරීක්ෂා කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කාර්යය අධීක්ෂණයට තේරීම්භාර නිලධාරීන් විසින් පත්කොට ඇති නිලධරයා විසින් කරනු ඇත. එසේ නොවන අවස්ථාවල දී රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරන තැපැල් ඡන්ද හිමියන්ට ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා අවස්ථාව ලබා නොදිය යුතු බවට සහතික කිරීමේ නිලධාරින් වෙත දන්වා සිටිනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්